# සාක්කිය ඉරිතැලි කඳ

මලිති විජේසේකර

අව් වැසි සුළං හඳුනන
අකුණු සර ළඟ නොසැලෙන
සෘතුවෙන් සෘතුව ගතවෙන
දුර බලා නිති ඉවසන

රළු පරළු අතු අග
කිසිම දා මල් නොපිපුණ
බඹර ගුමුවක් නොඇසුන
තනිකමක් හා තනිවුණ

හිස තියා මුල් රැස මැද
බදා පහුරින් රළු කඳ
ලතාවක මිමිනුම් හරෑ
ඇසුණි පැටලී සිහිනෙක

අහම්බෙන් මේ මග
ගියොත් නෙත රැවටෙනු ඇත
ලියවැළක සෙනෙහස මැද
මල් රැසක් දිලිසුණා තුරු හිස

# හවුල

චිරන්ත ජයසේන



පතා අප හිසට අපඬතේ සෙවණ
අප දෙදෙනගේ අතේ මහලු වුණ
මුල්ම පොප් රිවිට් ගන් එක හරෑයි
පරණ ආයුධ පෙට්ටියේ වැතිර

පුදා ශක්තිමත් දේහය දිනක
අපේ ඩහ දියෙන් මලකඩ පැළඳ
මුලු ගැන්විලා බලා හිඳි තුටින
රිවට් ඇන හිසක කඳුළක් පෙනේ

නගරයේ සුපිරි වෙළඳ බිම් වල
ඇලුමිනියම් කියුබිකල් රාමු
දෙදරවා වේදනා හඬ නගයි...

උකස් කර මිත්‍රකම් වල සවිය
ගත් බැංකු ණය ද අයිරා වලින
මා ප්‍රගුණ කළ වෙළඳ උපා මං
වල සැබෑ අනුහසින් දෙපෙති වුණ
මල් පලා පල දරන තුරකි අද
අපේ වෙහෙසින් නැගුණ මෙ.වැඩ බිම

ඒ බිමේ තනි අයිතියට ලොබින
මිතුර ප්‍රාණය සදිසි අප බැඳුම
පස මිතුරු පිළිලයෙන් කෙලෙසනා
උපා මං දෙසුවෝ කවරහුද?

ඇවැසි නැත සට කපට කබා හැඳි
පෙරකදෝරුවන්ගේ නුහුරු වැකි
ඉදින් මේ බිම රැදෙනු නොරිසිමය
අපේ සැමරුම් බුර බුරා නැගෙන

මෙඬහිස් අත හැර කිසිත් ඇවැසි නැත
නැවුම් දිවියක මානයන් කියන
හිත මිතුරුකම් මියෑදුනු සිතින්
සුබපතා නිහඬ වන්නෙමි ඉතින...

# අභිනිෂ්ක්‍රමණය

දුක දනිමි
සීනුවට අවදිවී
සීතලේ ඇඳ පැළඳ
දුම්රිණියට දුව යෑම දුකක් මැයි
කළු කෝපි උගුරකින්
ගිල දමා පාන් පෙති
පණිරිසණක තිරය මත ගල් ගැසී
සංසාර චක්කරේ පැද යාම
දුකක් මැයි

දුකට හේතුව දනිමි
කොමසාරු මැදුර ලඟ
පෝලිමේ තෙරපිලා
වීසාව අයැදීම හේතුවය
විරැකියාවේ බරින් පීඩිතව
ජනසවිය එපාවී දුර්මුඛව
පලා නොම ගිය කරුණ හේතුවය

දුක නැසුම මම දනිමි
මේ මහා තරඟයෙන්
බේණිරිලා පලා ගොස්
නිදන්නට හැකි වුනොත් දුක නැතිය
උපන් ගම රට වෙතට
යලි ගොසින්
ඉඳින්නට හැකි වුනොත්
දුක නැතිය

දුක නසන මග දනිමි
දරුවනගෙ ඉගෙනීම ඉවර වී ... ...
ගේ උගස් ගිනුම අවසාන වී ... ...
පනස් පහ උද වී ... ...
... ... ... ... ... ...

පැහැදිලිය චතුර් සත්‍යය
අපැහැදිලිය අභිනිෂ්ක්‍රමණය

රසික සූරියආරච්චි

## පහන් වැට

# පියතුමණී

දා බිඳු හෙලා දිරියෙන් දැඩි කල          දෝණී
තුරුලෙහි හොවා නෙතු මෙන් රැකගත්          දෝණී
හෙළ කුල සිරිත් ලෙද කුලගෙට දුන්          දෝණී
සව්සිරි සොයා නොරටක තනි වූ          දෝණී

සීතල හිම රටේ සිරියට සිත්          බන්දා
මා පිය සෙනෙහසත් ඈ උගසට          බැන්දා
තැබූ පය පෙරට ආපසු ගනු බැරි          හින්දා
සවසක් පුරාවට සැපසේ දුක්          වින්දා

නික්මුණ දින ඔබේ පාමුල හිස          රන්දා
ඉකිබිඳ හැඩූයුරු නෙතු කඳුලැලි          බන්දා
ඔබ තනිකොට එන්ට මා පව්කළ          හින්දා
මනැසින් දහස් වර මැරි මැරි දුක්          වින්දා

ලෙඩවූ දිනෝ දිවගොස් සුවදුක්          විමසා
ආ මුත් හනි හනික ඔය හදවත          සනසා
හැරගිය දිනෝ අප සැම මනුදම්          නොලසා
ඔබ ළඟ රැදෙනු බැරි විය පින් මඳ          විලසා

පිය සෙනෙහස තවම හිමි දූ පුතුනි          උතුම්
මොහොතක් සිතනු මැන ගොනුකොට හදෙහි පැතුම්
පියවරු රැදෙනු නැත සැමදා විලස          සිතුම්
යුතුකම කරනු මැන පෙරටුව කුළුණු          පැතුම්

නිරංජලා රාජපක්ෂ



# මරණයේ ශාන්තුවරයානෝ

උපුල් සේනාධීරගේ

එකල්හි...
ගිගුම් දුන් අහස අසණි එළි සුවහසක් දැවී
පතිත විය ආලෝක දහරාවක් කවුළුවෙන්
ගලවා එක සැණෙන් විද්‍යුත් හෘද ස්පන්දන
ස්වසන යන්ත්‍රයේ නාලිකා
නැගී සිටියේය ඔහු
මරණයේ සීතල සයනයෙන්

යාගහෝම ද නෙක මන්ත්‍ර ස්තෝත්‍ර
දේව ගීතිකා ද නෙක පිරිත් ගායනා
උච්චාවචන නාද මාලා අතර
වැසී ගිය සුධවල වතෙහි හිම පැහැ ලෝගුවකි
අතක් අහසට දිගු කළ සඳ
වළාකුළු ද සැණෙකින් නතර වුණි
සුරත් ඇස් දල්වා අවසග වතින් යුතු ව
අඩ දණියෙන් නමස්කාර කළෝය
මානවක මානවිකාවෝ ඔහුට

කිමැයි නොලියන්නේ මේ මහා ප්‍රාතිහාර්යය
විමසුවෝ පුවත් කතුවරු
උනුන් අතවැසි වාර්තාකරුවන්ගෙන්
දල්වා ගත් කැමරා කාච
තැනීය අපූර්ව ටෙලි නාටක
වීරයෙක්... ඔහු වීරයෙක්
නැත... ශාන්තුවරයෙක්
සුර ලොවින් බිමට බට

එකල්හි... අත දිගු කලහ ඔවුහු
අයැද කෑමට හා බීමට යමක්
රතු මුද්‍රික පානයද විභූති ද
බෙදා දුනි ඔහු උනුන් අතර
ශාන්තියක්ම වේවා තෙපි හට

නොදුටුවෙද ඔහු මුව දෑල
සැ[illegible]වුණු නල දත් යුග
නොදුටුවෙද ඔහු උල් සවන් පත්
ත්‍රිශූලයක් බඳු වල්ගය
ඔහු අත සැ[illegible]වී චුම්බක අවිය
ප්‍රති උට්ඨානය විය
මරණයේ ශාන්තුවරයාණෝ
තිරසර කෙරුමට මරණය
කම්කරුවෙනි... ගොවියෙනි...
සමාජ ක්‍රියාකාරිකයෙනි...
හඳුනා ගනු මැනව
මේ අඳුරු නිමේෂය
නැග සිටිය යුතුය මෙඬමොහොත
මෙ අඳුරු මරණයට එරෙහිව